# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය / க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2025

විෂය අංකය / பாட இலக்கம்: **25**

විෂයය / பாடம்: **ශ්‍රී ලංකා ඉතිහාසය**

## ලකුණු දීමේ පටිපාටිය / புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය / பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 5 | 21. | 3 | 31. | 3 |
| 02. | 5 | 12. | 5 | 22. | 2 | 32. | 2 |
| 03. | 2 | 13. | 4 | 23. | 1 | 33. | 1 |
| 04. | 4 | 14. | 3 | 24. | 3 | 34. | 3 |
| 05. | 5 | 15. | 2 | 25. | 1 | 35. | 1 |
| 06. | 1 | 16. | 4 | 26. | 1 | 36. | 1 |
| 07. | 2 | 17. | 2 | 27. | 2 | 37. | 2 |
| 08. | 3 | 18. | 5 | 28. | 5 | 38. | 5 |
| 09. | 4 | 19. | 4 | 29. | 4 | 39. | 4 |
| 10. | 2 | 20. | 5 | 30. | 1 | 40. | 1 |

✪ විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට / ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் 1 × 40 = 40

[සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා ඉතිහාසය | I (II කොටස) | 25 S I |
| இலங்கை வரலாறு | I (பகுதி II) | |
| History of Sri Lanka | I (Part II) | |

ශ්‍රී ලංකා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා

**උපදෙස්:**

※ පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**

※ **II** කොටස **A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.

※ **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.

※ **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ශ්‍රී ලංකාවේ දළ සිතියමක් I කොටස** සමඟ සපයා ඇත.)

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

| | | |
|---|---|---|
| (i) කලා ඔය | (ii) ඌව පළාත | (iii) කොට්ටියාරම |
| (iv) ගල්ඔය ජලාශය | (v) අනුරාධපුරය | (vi) මාතර |
| (vii) කන්කසන්තුරේ | (viii) හම්බන්තොට | (ix) ගම්පොළ |
| (x) කොළඹ | (xi) කනගරායන් ආරු | (xii) තලෙයිමන්නාරම |

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි.)

## B කොටස

**2.** පහත සඳහන් මාතෘකා යටතේ ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම එහි දේශපාලන, සංස්කෘතික හා ආර්ථික ඉතිහාසය හැඩගැස්වීමෙහිලා බලපෑ ආකාරය පරීක්ෂා කරන්න.

(i) ඉන්දියානු උපමහද්වීපයට සමීප ව දූපතක් ලෙස පිහිටීම (ලකුණු 08 යි)

(ii) පෙර අපර දෙදිග වෙළෙඳ මාර්ගයේ කේන්ද්‍රස්ථානයක පිහිටීම (ලකුණු 08 යි)

**3.** "බොහෝ බාධක ජයගත් වලගම්බා රජුගේ දේශපාලන ජයග්‍රහණය කැපී පෙනෙන කාර්ය සංසිද්ධියකි."

(i) වලගම්බා රජුගේ පියා නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) වලගම්බා රජුට එරෙහි ව කැරලි ගැසූ ප්‍රාදේශීය ප්‍රධානියා කවුද? (ලකුණු 01 යි)

(iii) වලගම්බා රජුගේ පාලන සමයේ දී ලංකාවට පැමිණි ආක්‍රමණිකයන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02 යි)

(iv) වලගම්බා රජුගේ දේශපාලන කාර්ය සාඵල්‍යය පරීක්ෂා කරන්න. (ලකුණු 12 යි)

**4.** දෙවන පරාක්‍රමබාහු රජ සමයේ දේශපාලන හා සංස්කෘතික වැදගත්කම පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) දීපවංශය

(ii) මාගම රාජධානිය

(iii) පොළොන්නරු යුගයේ වාරි කර්මාන්ත

(iv) ආර්යචක්‍රවර්තී රජ පෙළපත

(ලකුණු 08 × 2 = 16 යි)

අ.පො.ස. උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## C කොටස

**6.** "පෘතුගීසීහු එවකට මුහුදුබඩ පළාත්වල පැවති ස්වදේශීය පරිපාලන ව්‍යුහය ස්වකීය අරමුණු සඳහා යොදා ගත්හ."

(i) ලංකාවේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසි පාලනයේ ප්‍රධාන අරමුණු කවරේ ද? (ලකුණු 05 යි)

(ii) පෘතුගීසීහු ස්වකීය අරමුණු උදෙසා ලංකාවේ මුහුදුබඩ පළාත්වල පැවති ස්වදේශීය පරිපාලන ක්‍රමය භාවිත කළ අන්දම පැහැදිලි කරන්න. (ලකුණු 11 යි)

**7.** "ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සහ බ්‍රිතාන්‍යයන්ගේ ආධාර ලත් උඩරට රදළයන් යන දෙපාර්ශ්වය අතර හටගත් ගැටුමේ ප්‍රතිඵලයක් වශයෙන් උඩරට රාජධානියේ වැටීම සිදු විය."

(i) සිහසුනට පත්වීමට පෙර ශ්‍රී වික්‍රම රාජසිංහ රජු හඳුන්වන ලද නම කුමක් ද? (ලකුණු 01 යි)

(ii) 1803 දී උඩරට රාජධානිය ආක්‍රමණය කරන ලද බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා නම් කරන්න. (ලකුණු 01 යි)

(iii) ශ්‍රී වික්‍රම රාජසිංහ රජ සමයේ දී මහාදිකාරම තනතුර දැරූ රදළයන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02 යි)

(iv) 1815 දී බ්‍රිතාන්‍යයන් උඩරට රාජධානිය අල්ලා ගත් ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 12 යි)

**8.** 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පහත සඳහන් මාතෘකා යටතේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමග සංසන්දනය කරන්න.

(i) විධායකය

(ii) ව්‍යවස්ථාදායකය (ලකුණු 16 යි)

**9.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) කෝට්ටේ ධර්මපාල

(ii) ශ්‍රී ලාංකේය සමාජය හා සංස්කෘතිය කෙරෙහි ලන්දේසීන් ඇති කළ බලපෑම

(iii) දහනවවන සියවසේ දෙවන භාගයේ ඇති වූ හින්දු හා ඉස්ලාම් පුනර්ජීවනය

(iv) අමද්‍යප ව්‍යාපාරය

(ලකුණු $08 \times 2 = 16$ යි)

***

## A කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

| | | |
|---|---|---|
| (i) කලා ඔය | (ii) උඩවලව | (iii) කොට්ටියාරම |
| (iv) ගල්ඔය ජලාශය | (v) අනුරාධපුරය | (vi) මාතර |
| (vii) කන්කසන්තුරේ | (viii) හම්බන්තොට | (ix) ගම්පොළ |
| (x) කොළඹ | (xi) කනගරායන් ආරු | (xii) තලෙයිමන්නාරම |

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි.)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

[... பதிப்புரிமையுடையது/All Rights Reserved]


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

| | | | |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ඉතිහාසය<br>இலங்கை வரலாறு<br>History of Sri Lanka | I<br>I<br>I | 25 | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. } 1

විභාග අංකය / சுட்டெண் / Index No. } ......................................



## B කොටස

2. පහත සඳහන් මාතෘකා යටතේ ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම එහි දේශපාලන, සංස්කෘතික හා ආර්ථික ඉතිහාසය හැඩගැස්වීමෙහිලා බලපෑ ආකාරය පරීක්ෂා කරන්න.

(i) ඉන්දියානු උපමහද්වීපයට සමීප ව ද්වීපයක් ලෙස පිහිටීම (ලකුණු 08 යි)

**දේශපාලන**

- ජන සංක්‍රමණ සිදුවීම (විජය ඇතුළු පිරිස, භද්දකච්චානා කුමරිය හා ඇගේ සහෝදරයන්).
- දකුණු ඉන්දියානු ආක්‍රමණ ඇතිවීම (සේන ගුත්තික, එළාර, වලගම්බා, ධාතුසේන සමයේ ඇතිවුණු ආක්‍රමණ, ශ්‍රීමාර ශ්‍රීවල්ලභ, පළමුවැනි රාජරාජ, මාඝ, පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි ආක්‍රමණ)
- ශ්‍රී ලංකාවේ පාලකයන් විසින් දකුණු ඉන්දියාව ආක්‍රමණය කිරීම (පළමුවන ගජබාහු, පළමුවන පරාක්‍රමබාහු).
- මෙරට දේශපාලන සංස්ථා කෙරෙහි ඇති කරන ලද බලපෑම (රාජාභිෂේකය හා රාජත්වය, පරිපාලන තන්ත්‍රය තනතුරු නාම ආදිය).
- ලාංකික පාලකයන් යුධ අවස්ථාවලදී ආධාර ලබා ගැනීම (ඉළනාග, මානවම්ම, අගම්පඩි සේනාවල සේවය).
- ඇතැම් දකුණු ඉන්දියානු පාලකයන් සහයෝගය හා රැකවරණය පතා මෙරටට පැමිණීම (දෙවන සේන රජ සමය හා හතරවන දප්පුල රජ සමය).
- දකුණු ඉන්දියානු දේශපාලනයේ තීරණාත්මක වෙනස්වීම් මෙරට දේශපාලනයට බලපෑම (පාණ්ඩ්‍ය).

**සංස්කෘතික**

- බුදුදහම මෙරටට හඳුන්වා දීම හා බුදුසසුන මෙරට ස්ථාපිත වීම.
- ලේඛන, අක්ෂර හා භාෂාව හැඩ ගැසීම.
- කලාව හා ගෘහනිර්මාණ ශිල්පය කෙරෙහි බලපෑම - චිත්‍ර මූර්ති, කැටයම් ඇතුළුව.
- බෞද්ධ පූජනීය වස්තු මෙරටට රැගෙන ඒම (ශ්‍රී මහා බෝධිය, පාත්‍රා ධාතුව, දළදාව).
- කුල ක්‍රමය හා සිරිත් විරිත් ආදිය කෙරෙහි ඇතිවූ බලපෑම.
- මහායාන ධර්මයේ බලපෑම.
- හින්දු ජෛන ආගම්වල බලපෑම.
- හින්දු සංස්කෘතික බලපෑම පොළොන්නරුවේ පිහිටි ශිව දේවාල, පොළොන්නරු අවදියේ සඳකඩපහණින් ගවයා ඉවත් වීම.
- විවාහ සම්බන්ධතා.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

<u>ආර්ථික</u>

- වෙළෙඳ සම්බන්ධතා පැවැත්වීම (තපස්සු-භල්ලුක, සේන-ගුත්තික).
- දකුණු ඉන්දියානු වෙළෙඳ ශ්‍රේණි මෙරට වෙළෙඳාමේ යෙදීම (වලංජියාර්, නානාදේසී, නකරත්තාර්).
- විවිධ කර්මාන්ත ඇතිවීම.
- කෘෂි ආර්ථිකයට පදනම වැටීම.

පොදුවේ ගත් කල ඉන්දියානු ආභාසය ලැබූ නමුත් ඉන්දියාවට ආසන්නයෙන් දූපතක් ලෙස වෙන්ව පිහිටා තිබීම නිසා ලංකාවට අනන්‍ය ලක්ෂණ සහිතව වර්ධනය වූ බවද කිව හැකිය.

**(ලකුණු 08 යි)**

(ii) පෙර අපර දෙදිග වෙළෙඳ මාර්ගයේ කේන්ද්‍රස්ථානයක පිහිටීම (ලකුණු 08 යි)

- ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගත ස්ථානයක පිහිටා තිබීම නිසා ඈත අතීතයේ සිටම විදේශ රටවල් සමඟ ඉතා දියුණු වෙළෙඳ සම්බන්ධතා පවත්වා ගෙන යාමට හැකි වීම.
- මේ සම්බන්ධතා බටහිරින් රෝමය දක්වාත් නැගෙනහිරින් චීනය දක්වාත් ව්‍යාප්ත වීම.
- ශ්‍රී ලංකාව ආනයන (පිඟන්, මැටිබඳුන්, සේද රෙදි, සුවඳ විලවුන්, කපුරු, අශ්වයන් ආදිය) හා අපනයන (මුතු මැණික්, අලි ඇතුන්, ඇත්දත්, කැස්බෑ ලෙලි, කුරුඳු ඇතුළු කුළුබඩු) වෙළඳාමේ නිරත වීම.
- ඉන්දියාව, චීනය, රෝමය, පර්සියාව, ඇබිසීනියාව හා අග්නිදිග ආසියාතික රටවල් සමග වාණිජ සම්බන්ධතා පැවැත්වීම.
- පෙර අපර දෙදිග වෙළෙඳ භාණ්ඩ එක්රැස් කොට බෙදාහරින අන්තර් වෙළඳ මධ්‍යස්ථානයක් බවට ලංකාව පත්වීම (පර්සියානුවන් - කොස්මස් විසින් රචිත *ටොපොග්‍රැෆියා ක්‍රිස්ටියානා* කෘතියේ එන විස්තර).
- විදේශීය ලේඛකයන් තම කෘතිවලට ලංකාව පිළිබඳ විස්තර ඇතුළත් කිරීම (ක්‍රි. පූ. 4 වන සියවසේ විසූ ග්‍රීක ජාතික ඔනෙසික්‍රිටස්, මෙගස්තිනිස්, ඉරටොස්තිනිස්, ප්ලිනි, ටොලමි, ෆාහියන්, චා ඕ ජුකුවා, සුලෙයිමාන්, අල්බතානි, අල්බිරූනි, අල්ඉද්රිසි ආදීන්).
- වෙළෙඳ සම්බන්ධතා ප්‍රධාන වුවත් ඒ තුළින් යම් ප්‍රමාණයකට බෞද්ධාගමික හා සංස්කෘතික සම්බන්ධතාද වර්ධනය වීම (බෞද්ධ භික්ෂූන් වහන්සේ වෙළෙඳ නැව්වලින් පැමිණීම වජ්‍රබෝධි, ෆාහියන්, ගුණවර්මන්).
- දිවයින වටා පිහිටි වරාය නිසා ලංකාව මෙම වෙළෙඳ මාර්ගයේ වැදගත් තැනක් හිමිකර ගැනීම (දඹකොළ පටුන, මහාතිත්ථ, ගෝකණ්ණ, ගොඩවාය, ඌරාතොට, දේවනගර, ලංකාපටුන ආදිය පුරාණ යුගයේදී වඩාත් වැදගත් වීම; කොළඹ, ගාල්ල, මඩකලපුව, ත්‍රිකුණාමලය, කල්පිටිය, මීගමුව ආදිය විශේෂයෙන්ම බටහිර යටත්විජිතවාදීන්ගේ අවධානය දිනා ගැනීම).

- මුල් ජනපදිකයින්ගේ සංක්‍රමණ වරායන් ඔස්සේ සිදු වීම (තම්බපණ්ණි -විජය ඇතුළු 700ක පිරිස; ගෝකණ්ණ - භද්දකච්චානා ඇතුළු පිරිස හා ඇගේ සහෝදරයන්).
- ත්‍රිකුණාමල වරාය නූතන යුගයේදී ලංකාව කෙරෙහි බටහිර යුරෝපා ජාතීන්ගේ අවධානයට ලක් වීමට විශේෂ හේතුවක් වීම - විශේෂයෙන්ම ඉංග්‍රීසින්ගේ අවධානයට.

**(ලකුණු 08 යි)**

3. "බොහෝ බාධක ජයගත් වලගම්බා රජුගේ දේශපාලන ජයග්‍රහණය කැපී පෙනෙන කාර්ය සංසිද්ධියකි."

(i) වලගම්බා රජුගේ පියා නම් කරන්න. (ලකුණු 01 යි)

සද්ධාතිස්ස රජු

(ii) වලගම්බා රජුට එරෙහි ව කැරලි ගැසූ ප්‍රාදේශීය ප්‍රධානියා කවුද? (ලකුණු 01 යි)

තීය බ්‍රාහ්මණයා (තිස්ස)

(iii) වලගම්බා රජුගේ පාලන සමයේ දී ලංකාවට පැමිණි ආක්‍රමණිකයන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02 යි)

පුලහත්ථ, බාහිය, පණයමාර, පිළයමාර, දාඨික.

(iv) වලගම්බා රජුගේ දේශපාලන කාර්ය සාඵල්‍යය පරීක්ෂා කරන්න. (ලකුණු 12 යි)

- බල්ලාටනාග රජු ගෙන් බලය පැහැරගත් මහාරත්ථක මරා වලගම්බා රජු සිහසුනට පත්වීම; *මහාවංශය* ඇතුළු වංශකතා මෙන්ම *වංසත්ථප්පකාසිනී, නිකාය සංග්‍රහය, අට්ඨකතා* ආදී මූලාශ්‍ර මගින් තොරතුරු සොයා ගත හැකිවීම; අභිලේඛනවල රජු 'පිත මහරජ' යනුවෙන් හැඳින්වීම.
- මහාරත්ථකට එරෙහිව ප්‍රථමයෙන් තම බලය තහවුරු කර ගැනීම.
- මේ වන විට රුහුණේ නකුල ග්‍රාමයේ තීය හෙවත් තිස්ස, රජුට එරෙහිව කැරලි ගැසීම.
- එය මර්දනයට 'සතුරා සතුරාගෙන්ම නැසීමේ' උපක්‍රමය යොදා ගැනීම. පළමුවෙන් තීය බ්‍රාහ්මණයාට 'රාජ්‍යය නුඹගේ වේ' යැයි පවසා පංච ද්‍රවිඩයන්ට එරෙහිව ඔහු සටනට යොමු කිරීම තුළින් පංච ද්‍රවිඩයන් හමුවේ තීය බමුණා පරාජයට පත් කරවීම.
- පස් ද්‍රවිඩයන් සමග කොළබැල (කොළඹැල) නම් ග්‍රාමයේදී රජු සටන් වැද පරාජයට පත්ව තීර්කාරාම ද්වාරයෙන් පලාගිය රජු අනුරාධපුරයට පැමිණීම.
- පසුව සෝමාදේවිය, අනුලා දේවිය, මහාචූල මහානාග යන පිරිස සහ පාත්‍රා ධාතුව සමග රථයේ නැග පලා යාම (ගිරි නම් නිගණ්ඨයා 'මහා කළු සිංහලයා පලා යයි' යනුවෙන් කෑගැසීම හා සෝමා දේවිය රථයෙන් බැස ද්‍රවිඩයන්ට භාරවීම).
- රජු ඇතුළු පිරිස වෙස්සගිරි විහාරබද වනයෙහි සැඟවීම හා කුපික්කල මහාතිස්ස තෙරුන්ගේ රැකවරණය ලැබීම.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- සල්ගල මාතුවේලයේ වාසය කරන අතරතුර තණශිව නම් ප්‍රාදේශීය පාලකයාගේ රැකවරණය ලැබීම.
- මේ වනවිට ඉතිරිව සිටි ද්‍රවිඩයන් පස් දෙනා එකිනෙකා මරා ගනිමින් අනුරාධපුරයේ පාලනය ගෙන යෑම.
- රජු අතින් තණශිව මරණයට පත්වන අතර සල්ගල විසූ ජනයා රජුට විරුද්ධව නැගී සිටීම හා රජු එය සමනය කිරීම.
- වලගම්බා රජු ඇමතියන් පිරිවරා ගෙන වලස්ගල විහාරයේ බුද්ධ පූජාවට ගිය අවස්ථාවේ රජු අතින් කපිසීස මරණයට පත් වීමත් පසුව සෙසු පිරිස රජු අතහැර යාම. තිස්ස තෙරුන් හා මහාතිස්ස තෙරුන් කරුණු පහදා රජු සහ පිරිස සමගි කරවීම.
- පසුව රජු වෙස්සගිරිය, ශිලාසොබ්බ ඛණ්ඩය, මලයදේශය ආදී ප්‍රදේශවල සැඟව සිට භික්ෂූන් වහන්සේගේද සහාය ලැබ සේනාව සංවිධානය කිරීම.
- අවසන් දමිල පාලකයා වූ දාඨිකට එරෙහිව සටන් කොට නැවත තම බලය අනුරාධපුරයේ පිහිටුවීම.

**(ලකුණු 12 යි)**

4. දෙවන පරාක්‍රමබාහු රජ සමයේ දේශපාලන හා සංස්කෘතික වැදගත්කම පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

- දඹදෙණි රාජධානිය පාලනය කරමින් ලක්දිව එක්සේසත් කළ ශ්‍රේෂ්ඨතම පාලකයා දෙවන පරාක්‍රමබාහු රජතුමාය (ක්‍රි.ව. 1236-1270).
- සිය පියා වූ තුන්වන විජයබාහු රජතුමාගේ ඇවෑමෙන් රාජත්වයට පත්වූ ඔහු වසර 34 ක තම පාලන කාලය තුළ දඹදෙණි රාජධානියේ දේශපාලන ස්ථාවරත්වයක් හා සංස්කෘතික ප්‍රබෝධයක් ඇති කළේය.

**දේශපාලන වැදගත්කම**

- ස්වකීය රාජ්‍ය කාලය තුළ ආක්‍රමණ තුනකට මුහුණ දීමට මොහුට සිදු වූ අතර එම ආක්‍රමණ සාර්ථකව මැඩ පැවැත්වීමට හෙතෙම සමත් විය.

  එම ආක්‍රමණ මෙසේය:

1) මලයා අර්ධද්වීපයේ සිට පැමිණ බෞද්ධ රජෙක් යැයි හඳුන්වාගත් චන්ද්‍රභානුගේ පළමු ආක්‍රමණය (ක්‍රි ව. 1247).

   මෙම ආක්‍රමණය තම බෑනා වූ වීරබාහු කුමරු යවා මැඩ පැවැත්වීම හා චන්ද්‍රභානු ඇතුළු ආක්‍රමණික කණ්ඩායම ලක්දිව උතුරට පලවා හැරීම.

2) කාලිංග මාඝ රජරට ආක්‍රමණය කොට වසර 40 ක් (ක්‍රි.ව. 1215-1255) ගෙන ගිය පාලනය මැඩ පැවැත්වීම.

සිංහල සේනාවේ හා පාණ්ඩ්‍ය පාලක ජටාවර්මන් සුන්දර පාණ්ඩ්‍ය රජුගේ ආධාරයෙන් මාඝ පාලනය සම්පූර්ණයෙන්ම අවසන් කළේ මෙම රජුය.

3) මුල් අවස්ථාවේදී උතුරට පලවා හරින ලද චන්ද්‍රභානු දළදා වහන්සේ හා පාත්‍රා ධාතුව සහිතව පැමිණ ලංකා රාජ්‍යය ඉල්ලා නැවතත් දඹදෙණිය ආක්‍රමණය කළද රජු තම පුත් විජයබාහු ප්‍රධාන සිංහල හමුදාවේ හා ජටාවර්මන් වීරපාණ්ඩ්‍ය රජුගේ ආධාරයෙන් චන්ද්‍රභානුගේ ආක්‍රමණ අවසන් කළේය.

- පුත්තලම, කල්පිටිය, මන්නාරම, පොතුවිල්, පානම ආදී ප්‍රදේශවල නැගී ආ වන්නියාර්වරුන් මැඩ පවත්වා ඔවුන් දඹදෙණි රාජ්‍යයේ මධ්‍ය පාලනයට අවනත කරගැනීම.

**සංස්කෘතික වැදගත්කම**

- රාජධානිය රජරටින් නිරිතදිගට විතැන්වීමත් සමග ඇති වූ විශාලතම සංස්කෘතික ප්‍රබෝධය දෙවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ ඇති විය.
- කාලිංග මාඝ පරාජය කිරීමෙන් පසුව බෙලිගල තැන්පත් කර තිබූ දළදා වහන්සේ දඹදෙණියේ විජයසුන්දරාරාමයේ දෙමහල් දළදා මන්දිරයක් තනවා එහි තැන්පත් කිරීම. සතියක් පුරා දළදා පූජෝපහාර පැවැත්වීම මෙන්ම වාර්ෂිකව මහා දළදා පෙරහර පැවැත්වීම.
- දිඹුලාගල මේධංකර නාහිමියන්ගේ අනුශාසකත්වයෙන් පිරිහී ගිය භික්ෂු විනය නැවත පුනර්ජීවනය කරන්නට දඹදෙණි කතිකාවත පිහිටුවීම.
- විනාශවී ගිය ත්‍රිපිටක පොත්පත් වෙනුවට දඹදිවින් ත්‍රිපිටක පොත් ගෙන්වා ලක්දිව භික්ෂූන් ධර්මධර, විනයධර භික්ෂු පිරිසක් බවට පත්කිරීමට උත්සාහ කිරීම.
- දේශපාලනික ව්‍යාකූලත්වය හේතුවෙන් පිරිහෙමින් පැවැති උපසම්පදා විනයකර්ම නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා වාර්ෂිකව උපසම්පදා විනය කර්ම පැවැත්වීමට පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලබාදීම.
- වසර 40 ක මාඝගේ රජරට පාලනය හේතුවෙන් හා චන්ද්‍රභානුගේ ආක්‍රමණයෙන් කාලයත් සමඟ විනාශ වී ගිය කැලණි විහාරය, බෙන්තොට විහාරය, දෙවිනුවර උපුල්වන් දේවාලය වැනි වෙහෙර විහාර හා දේවාල ප්‍රතිසංස්කරණය කරවීම.
- ආරණ්‍යවාසී විදර්ශනාධූරි භික්ෂූන් වහන්සේ උදෙසා පළාබත්ගල ආරණ්‍ය සේනාසනය ඉදිකොට පූජා කිරීම, ශ්‍රීපාදස්ථානයේ නවකර්ම සිදුකිරීම හා රත්නපුර මහ සමන් දේවාලයට නොයෙක් පුද පූජා සිදු කිරීම.
- ග්‍රාමවාසී ග්‍රන්ථධූර භික්ෂූන් වහන්සේගේ ආගමික, අධ්‍යාපනික හා සාහිත්‍ය කාර්යයන් උදෙසා දඹදෙණිය විජයසුන්දරාරාම පිරිවෙන, කුරුණෑගල මහේන්ද්‍රභානු පිරිවෙන, වාකිරිගල පිරිවෙන වැනි පිරිවෙන් ආරම්භ කිරීම හා එම පිරිවෙන් නඩත්තුවට අනුග්‍රහ දැක්වීම.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- සිංහල, පාලි, සංස්කෘත, දෙමළ යන සිව් භාෂාවන්ගේ ප්‍රගමණය උදෙසා දායකත්වය ලබාදීම හා දඹදෙණි යුගයේ අග්‍රගන්‍ය පඬිවරුන් වූ සංඝරාජ සංඝරක්ඛිත, දිඹුලාගල මේධංකර, බුද්ධපුත්‍ර, වාචිස්සර, ධර්මසේන, අනෝමදස්සි, වනරතන තෙරුන් වහන්සේ වැනි සාහිත්‍යධර භික්ෂූන් වහන්සේලාට විවිධ අනුග්‍රහයන් දැක්වීම.
- පිරිවෙන් අධ්‍යාපනය ලද දෙවන පරාක්‍රමබාහු රජතුමාද සාහිත්‍යකරණයේ නිරතවීම - *කව්සිළුමිණ, විසුද්ධිමග්ග සන්නය, වනවිනිස*. මේ නිසාම දෙවන පරාක්‍රමබාහු රජතුමා 'කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන' උපාධි නාමයෙන් හැඳින්වීම.

**(ලකුණු 16 යි)**

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) දීපවංශය
(ii) මාගම රාජධානිය
(iii) පොළොන්නරු යුගයේ වාරි කර්මාන්ත
(iv) ආර්යචක්‍රවර්තී රජ පෙළපත

(ලකුණු 08 × 2 = 16 යි)

**(i) දීපවංශය**

- අනුරාධපුර අවධියේ රචිත මෙය දැනට නොනැසී පවත්නා ආදීතම වංශකතාව වශයෙන් සැලකෙන අතර එය මාගධී භාෂාවෙන් ගද්‍යයෙන් හා පද්‍යයෙන් ලියා ඇත.
- ක්‍රි. ව. හතරවන සියවසේ රචනා කර ඇති *දීපවංශයේ* බුදුන් වහන්සේගේ ලංකාගමනයේ සිට මහසෙන් රජු දක්වා කාලය පිලිබඳ තොරතුරු අඩංගු වේ.
- මෙහි පරිච්ඡේද විසි දෙකකි. කතෘ අඥාත වේ.
- මෙහි භික්ෂුණීන් පිළිබඳ වැඩිපුර තොරතුරු අඩංගු බැවින් මෙය භික්ෂුණීන් විසින් ලියන්නට ඇතැයි අනුමාන කෙරේ.
- *මහාවංශය* රචනා කිරීමේදී *දීපවංශය* පාදක කරගෙන ඇත.
- *මහාවංශය දීපවංශයේ* අට්ඨ කතාව ලෙස මතයක් ඇතිවීමට තරම් මෙම කෘති දෙකෙහි සමානතා ඇති අතර ඇතැම් තැනක එකම ගාථාව ග්‍රන්ථ දෙකේම දක්නට ලැබේ.
- *දීපවංශයේ* බුද්ධ චරිතයේ ඇතැම් සිදුවීම් ද, උන්වහන්සේගේ ලංකාගමනය පිළිබඳවද විස්තර කිරීමෙන් පසුව විජය රජුගේ රාජ්‍ය කාලයේ පටන් මහසෙන් රජුගේ රාජ්‍ය කාලයේ අවසානය දක්වා ලංකා ඉතිහාසයේ රාජ නාමාවලිය ඇතුළු තොරතුරු රැසක් දක්වා ඇත. මේවායේ ඓතිහාසික කරුණු සංස්කරණය නොකොට ඒ අයුරින්ම ඉදිරිපත් කොට ඇත.
- *දීපවංශය, මහාවංශයට* වඩා ප්‍රමාණයෙන් කුඩා වුවත් *මහාවංශයේ* දක්නට නොලැබෙන තොරතුරුද මෙහි අන්තර්ගතව ඇත.

  මහා සම්මත රජ පරම්පරාවට අයත් ඇතැම් රජවරුන්ගේ නම්
  ප්‍රථම ධර්ම සංගායනාවේදී ධර්මය පිටක වශයෙන් සංගායනා කිරීම
  පණ්ඩුවාසුදේව රජුගේ පුතුන් දහ දෙනාගේ නම්
  සංඝමිත්තා තෙරණිය සමඟ වැඩම කළ අවශේෂ භික්ෂුනීනගේ නම්

- භාෂා ශෛලියේ විවිධත්වයක් ඇති අතර හා පුනරුක්ති දෝෂ ඇත.
- විධිමත් සැලසුමකින් තොරවීමද ලක්ෂණයකි.

- මෙය එක් කතුවරයකුගේ කෘතියක් නොවේ. කතුවරු කීපදෙනෙක් ලියා තිබූ කොටස් එකට එකතු කොට සකස් කළ සංග්‍රහයක් බව පැහැදිලි වේ. එසේ කිරීමේදී කරුණු සංස්කරණය කර නොමැත.

උදාහරණ: රුවන්වැලිසෑය සහ ලෝහප්‍රාසාදය සාදන ලද්දේ කවුරුන්ද යන්න දැක්වීමේදී එක් තැනක දුටුගැමුණු රජතුමා කරවූ බවත් තවත් තැනක සද්ධාතිස්ස රජතුමා කරවූ බවත් දැක්වීම.

**(ලකුණු 08 යි)**

**(ii) මාගම රාජධානිය**

- මාගම රාජධානියේ ආරම්භක පාලකයා ලෙස සැලකෙන්නේ මහානාග රජුය. ඔහු අනුරාධපුරයේ රජ කළ දේවානම්පියතිස්ස රජුගේ සොහොයුරාය.
- වංශකථා දක්වන පරිදි රජගෙදර ඇතිවූ අභ්‍යන්තර ආරවුලක් නිසා මහානාග යුව රජ දකුණේ කිරිඳි ඔය අසල මාගම මුල් කොට ගෙන (වත්මන් තිස්සමහාරාමය) ප්‍රාදේශීය රාජධානියක් පිහිටුවීය.
- ඔහුගෙන් පසුව බලයට පත්වන්නේ ඔහු පුත් තිස්ස කුමාරයාය. මහානාග යුව රජුගේ බිරිඳ ~~අනුලා බිසව~~ යටාල විහාරයේදී පුත් කුමරා බිහිකළ බැවින් ඒ කුමරා යටාලතිස්ස නමින් හැඳින්විණ.
- යටාලතිස්ස රජුගෙන් පසුව මාගම පාලකයා බවට පත්වන්නේ ගෝඨාභය රජුය. ඔහු විසින් කතරගම දසබෑ රජුන් ඝාතනය කරවා ඊට දඬුවම් ලෙස මහවැලි ගඟේ එගොඩ මෙගොඩ විහාර 500 බැගින් කරවූ බව *ධාතුවංශයේ* සඳහන් වේ.
- ගෝඨාභය රජුගෙන් පසුව කාවන්තිස්ස පාලකයා බවට පත්වේ. ඔහු එහි ශ්‍රේෂ්ඨතම පාලකයා ලෙස සඳහන් වේ.
- කාවන්තිස්ස රජුගේ කාලයේ කතරගම හා මාගම අතර පැවති ගැටුම විවාහ සබඳතා මගින් සමථයකට පත් කළ බව යාල අභය භූමිය අසල කොටාදැමූහෙල ලෙන් ලිපි මගින් හෙළි වේ.
- කාවන්තිස්ස රජුගේ කාලය මාගම රාජධානියේ බුදු සමය ව්‍යාප්තවීම පිළිබඳ වැදගත් කාලසීමාවකි.

  උදාහරණ: තිස්ස මහාවිහාරය කරවීම - කිරින්ද ටැම් ලිපිය; සිතුල්පව්ව විහාරය; ගම්ටිඨවැලි විහාරය; කුටාලි විහාරය; සිලාපස්ස පිරිවෙන ආදී වෙහෙර විහාර.

- කාවණ්තිස්ස රජතුමා මාගම පාලනය කරන සමයේ එළාර රජු රජරට පාලනය කළේය. කාවන්තිස්ස රජු මාගම මුල් කර ගනිමින් එළාරගෙන් රජරට බේරා ගැනීම සඳහා සැලසුම් සකස් කළේය.
  - දකුණ එක්සේසත් කරමින් කතරගම, කල්‍යාණි, සේරු, සෝම, ලෝණ යන ප්‍රාදේශීය රාජ්‍ය අවනත කර ගැනීම.


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- දස මහා යෝධයන්ගෙන් සමන්විත යුද හමුදාවක් සකස් කිරීම.
- අවි ආයුධ කම්හල් ඇතිකිරීම.
- තම පුත් තිස්ස ලවා නැගෙනහිර ප්‍රදේශයේ කුඹුරු අස්වැද්දීම.

➢ මේ පසුබිම තුළ කාවන්තිස්ස රජුගේ වැඩිමහල් පුත් ගැමුණු කුමාරයා, මාගම මුල් කොට ගනිමින් එළාරගෙන් රට බේරා ගැනීමට සැලසුම් සහගත යුධ ව්‍යාපාරයක් සංවිධානය කිරීම.

➢ ඒ අනුව, දුටුගැමුණු රජු එළාරගෙන් රට නිදහස් කොට ප්‍රථමවරට රට එක්සේසත් කරමින් අනුරාධපුරයේ රජ විය.

**(ලකුණු 08 යි)**

**(iii) පොළොන්නරු යුගයේ වාරි කර්මාන්ත**

➢ රජරට ශිෂ්ටාචාර සමයේ (අනුරාධපුර හා පොළොන්නරු යුග) පාලකයෝ වාරිකර්මාන්ත සඳහා අනුග්‍රහය ලබා දුන්හ.

➢ රජරට වාරි කර්මාන්ත දියුණුවේ උච්චතම අවස්ථාව පොළොන්නරු යුගයේදී සනිටුහන් වේ.

➢ පළමුවන විජයබාහු රජතුමාට රට එක්සේසත් කිරීමේ කාර්යභාරය නිසා වාරි කර්මාන්තයට විශාල සේවයක් සිදු කිරීමට නොහැකි වුවද වාරිමාර්ග නඩත්තුව සඳහා කටයුතු කළේය.

- රුහුණේ බුදුගුණ වැව ඔහු ඉදිකරන ලද්දකි.
- මහ වැව් ප්‍රතිසංස්කරණය.
  - ✓ මහාහේලි (මාළිය) පත්ත පාෂාණ, නාච්චදූව.
  - ✓ ආණවාපි (මහකනදරා) මහාදාරගල්ල (මහගල්කඩවල.)
  - ✓ මනිහිර (මින්නේරි) ආදිය.

➢ පළමුවන පරාක්‍රමබාහු රජතුමා, 'අහසින් වැටෙන එකදු ජල බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන සාගරයට නොයේවා' යන තේමාව පෙරදැරි කොටගෙන කෘෂි ආර්ථිකය නැංවීමට වාරිකර්මාන්ත කරවිය.

- වාරි කර්මාන්ත ඉදි කිරීමේ උච්චතම අවස්ථාවයි.
- සමුද්ද වාපි සංකල්පය - සරජ්ජ සමුද්දකරණ අවධිය.
- මොහුගේ කාලයේ වාරි ඉදිකිරීම කොටස් දෙකක් යටතේ දැක්විය හැකිය.

1) දක්ඛිණ දේශයේ පාලකයාව සිටි අවධිය:

- ✓ දැදුරු ඔය හරස්කොට කොට්ඨබද්ද, සූකර නිජ්ජර, දෝර දත්තික යන අමුණු බැඳ එම ප්‍රදේශයේ වගාවට අවශ්‍ය ජලය සැපයීම.
- ✓ පාඬා වැව විශාල කරවීම

✓ දක්ඛිණ දේශයේ වැව් 53ක් ප්‍රතිසංස්කරණය කරවීම. (මාගල්ල වැව, සිටු වැව, තඹවැව, වසාවැව, ගිරිබා වැව, පටාල වැව).

2) මුළු දිවයිනේ පාලකයා ලෙස වාරි කටයුතු:

✓ පරාක්‍රම සමුද්‍රය ඉදි කිරීම - තෝපා, දුඹුටුලු, එරබදු, බූදැවැටි කලහගල වැව් එක්කොට පරාක්‍රම තඩාග, මිහිඳුතල, ඒකාහවාපී පරාක්‍රමසාගර යන වැව් ඉදිකිරීම.

✓ පරාක්‍රම සමුද්‍රයෙන් වගාබිම් සඳහා ජලය ගෙන යාමට ඇළමාර්ග එකොළහක් ඉදිකරවීම (ගාම්භීර හේමවතී, නීලවාහිනී සසලවතී, සරභූ, නර්මදා, යමුනා, සරස්වතී, තම්බපණ්ණි.)

✓ ඇළ මාර්ග සංවර්ධනය කිරීම - අංගමැඩිල්ල, හත්තොට, කාලිංග, ගෝමති.

✓ වැව් රැසක් ප්‍රතිසංස්කරණය කිරීම - කලා වැව, මින්නේරිය වැව, කවුඩුල්ල වැව, ගිරිතලේ වැව, කන්තලේ වැව, නාච්චදූව වැව, මහකනදරා වැව, පදවිය වැව, යෝධ වැව.

✓ වංශකථා අනුව මොහු මහ වැව් 163ක්, කුඩා වැව් 2376ක් අමුණු 165ක් ඇළමාර්ග 3910ක් සොරොව් 341ක් ඉදිකොට, කැඩී බිඳී ගිය වැව් 1753ක් පිළිසකර කරවා තිබීම.

➢ නිශ්ශංක මල්ල රජු පරාක්‍රම සමුද්‍රයේ වැව් බැම්ම පිළිසකර කරවීම.

➢ කල්‍යාණවතී රැජින බතලගොඩ වැව පිළිසකර කරවීම.

(ලකුණු 08 යි)

### (iv) ආර්යචක්‍රවර්තී රජ පෙළපත

➢ මොවුහු ~~ක්‍රි.ව. 1310-1311~~ අතර කාලයේදී යාපනය කේන්ද්‍රකොට ගෙන රාජධානියක් ආරම්භ කොට පවත්වා ගෙන ගියහ.

➢ ආර්යචක්‍රවර්තී රජ පෙළපත පිළිබඳව හැදෑරීමට හැකි ප්‍රධාන මූලාශ්‍ර කිහිපයකි: *යාල්පාණ පෛව මාලෛයි, කෛලාසමාලෛයි, ශෙගරාසශේකරමාලෛ.*

➢ ආර්ය චක්‍රවර්තීන්ගේ මුල් භූමිය රමේශ්වරම යයි *ශේගරාශශේකර මාලෛ* හි දැක්වෙන අතර ඔවුන් චෝළ රජ පෙළපතට අයත් බව *යාල්පාණ වපෛමාලෛ* හි සඳහන් වේ.

➢ බ්‍රාහ්මණ කුලයට අයත් පිරිසක් ලෙස සැලකෙන මොවුහු පාණ්ඩ්‍ය රාජධානියේ දකුණේ ප්‍රදේශයක් වූ වෙච්චරුක්කයිනාඩු නම් ප්‍රාදේශීක අධිපතීන්ගේ පවුලකින් පැවත ආහ.

➢ විජය කුලංකෙ ශිංගෙ ආර්යන් මෙම පෙළපතේ පළමු පාලකයා ලෙස සඳහන් වේ

➢ 1344 දී ලංකාවට පැමිණි ඉබ්න් බතූතා ආර්යචක්‍රවර්තී පාලකයා 'ලංකාවේ සුල්තාන්' ලෙස හඳුන්වා ඇත 14 වන සියවසේදී යාපනය කේන්ද්‍ර කොට ගෙන මොවුහු රාජධානිය පිහිටවූහ. අගනුවර නල්ලූර්.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- පාණ්ඩ්‍ය-ආර්ය චක්‍රවර්ති පාලක සබඳතා මත 14 වන සියවසේ ආරම්භයේ සිට මොවුහු වඩාත් බලවත් වූහ. ක්‍රි. ව. 1344 වන විට යාපනය රාජ්‍යයේ සීමාවන් මන්නාරම දක්වා පැතිරුණි.
- 1347 දී පමණ යාපනයේ ආර්ය චක්රවර්තිහු අවස්ථා දෙකකදී දකුණට ආක්‍රමණ එල්ල කොට බදු අය කරගත් බව වාර්තා වේ.
- තුන්වෙනි වික්‍රමබාහු රාජ්‍ය කාලයේදී ගම්පොළ රාජධානියේ ඇතැම් ප්‍රදේශවලට සිය ආධිපත්‍යය පැතිරවීමට ආර්ය චක්‍රවර්තී පාලකයන් සමත් වූ බව මැදවල සෙල්ලිපියෙන් හා *රාජාවලියෙන්* පෙනී යයි.
- මෙකල දකුණු ඉන්දියාවෙන් පැමිණ වෙල්ලාල අධිපතිවරුන් යාපන අර්ධද්වීපයේ පදිංචිවී ඇත.
- ආර්යචක්‍රවර්තී පාලකයන් දොළොස් දෙනෙකු පිළිබඳ වාර්තා වේ: විජය කුලංකෙ ශිංගෙ ආරියන්, කුලසේකර ශිංගෙආරියන්, වික්කිරම ශිංගෙආරියන්, වරෝදය ශිංගෙආරියන්, මාර්තණ්ඩ ශිංගෙආරියන්, කුණපූෂණ ශිංගෙආරියන්, විරෝදය ශිංගෙආරියන්, ජයවීර (චෙයවීර) ශිංගෙආරියන්, කුණවීර ශිංගෙආරියන්, කණකශූරිය ශිංගෙආරියන්, සංකිලි.

(ලකුණු 08 යි)

## C කොටස

6. "පෘතුගීසීහු එවකට මුහුදුබඩ පළාත්වල පැවති ස්වදේශීය පරිපාලන ව්‍යුහය ස්වකීය අරමුණු සඳහා යොදා ගත්හ."

(i) ලංකාවේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසි පාලනයේ ප්‍රධාන අරමුණු කවරේ ද? (ලකුණු 05 යි)

- ➢ ප්‍රධාන වශයෙන් ආර්ථික අරමුණුද ද්විතියික වශයෙන් ආගමික අරමුණුද පෙරදැරි කරගෙන ලංකාවට පැමිණි පෘතුගීසීහු මෙරට පැවති දේශපාලන අස්ථාවරභාවය හේතු කොට ගෙන ප්‍රදේශ ආධිපත්‍යයක් ගොඩනගා ගැනීමට පෙළඹුණහ.
- ➢ වෙළඳ ආධිපත්‍යය ලබාගැනීම -යුරෝපයේ ඉහළ වෙළඳ වටිනාකමක් ඇති වෙළඳ ද්‍රව්‍ය ලබාගැනීම (කුරුඳු ප්‍රමුඛ කුළුබඩු) / මෙරට වරායයන් අවට වෙළෙඳ කටයුතුවල එවකට නියැලී සිටි අරාබි, චීන, මලබාර් ආදී ජාතීන් සතුව පැවති වෙළෙඳ ඒකාධිකාරය තමන් සතු කර ගැනීම.
- ➢ රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත කිරීම

(ලකුණු 05 යි)

(ii) පෘතුගීසීහු ස්වකීය අරමුණු උදෙසා ලංකාවේ මුහුදුබඩ පළාත්වල පැවති ස්වදේශීය පරිපාලන ක්‍රමය භාවිත කළ අන්දම පැහැදිලි කරන්න. (ලකුණු 11 යි)

- ➢ කෝට්ටේ රාජ්‍යයේ පැවති පරිපාලන ක්‍රමයේ පුළුල් වෙනස්කම් කළේ නැත.
- ➢ ස්වදේශික සමාජ, ආර්ථික සංස්ථා ස්වකීය අරමුණු සාධනය උදෙසා යොදා ගැනීම.
- ➢ පාරම්පරික ඉඩම් භුක්ති ක්‍රමය එලෙසම භාවිත කිරීම.
- ➢ ආදායම් එකතු කිරීම වඩාත් ක්‍රමානුකූල කරනු වස් තෝම්බු සකස් කිරීම.
- ➢ කුල ක්‍රමය හා අනිවාර්ය සේවා රාජකාරිය උපයෝගී කරගැනීම.
- ➢ දේශීය බද්ද සංවිධානය සිය ආර්ථික අරමුණු ඉටුකර ගැනීමට භාවිත කිරීම (මහබද්ද).
- ➢ දේශීය බදු ක්‍රමය උපරිම ලෙස භාවිතයට ගැනීම (පොල් අය).
- ➢ මරාල බද්ද ආගමික අරමුණ ඉටුකර ගැනීමට යොදා ගැනීම.
- ➢ කුල ක්‍රමය උපයෝගී කරගැනීමේදී තම ආගමික අරමුණු උදෙසා ධූරාවලිය නොතකා හැරීම.
- ➢ දේශීය පරිපාලන ඒකක ඒ අයුරින්ම පවත්වා ගෙන යාම (දිසාවනි, කෝරළ, පත්තු, ගම්).
- ➢ ස්වදේශික නිලබල ක්‍රමය පවත්වා ගෙන ගිය නමුත් පසුකාලීනව ඇතැම් තනතුරු සඳහා පෘතුගීසීන් පත් කර ගැනීම (දිසාවේ).
- ➢ ධර්මපාලගේ ඇවෑමෙන් කපිතාන් ජෙනරාල් විසින් රජුට අයත් බලතල භුක්ති විඳීම (පාලනය).

(ලකුණු 11 යි)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

7. "ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සහ බ්‍රිතාන්‍යයන්ගේ ආධාර ලත් උඩරට රදළයන් යන දෙපාර්ශ්වය අතර හටගත් ගැටුමේ ප්‍රතිඵලයක් වශයෙන් උඩරට රාජධානියේ වැටීම සිදු විය."

(i) සිහසුනට පත්වීමට පෙර ශ්‍රී වික්‍රම රාජසිංහ රජු හඳුන්වන ලද නම කුමක් ද? (ලකුණු 01 යි)

කන්නසාමි

(ii) 1803 දී උඩරට රාජධානිය ආක්‍රමණය කරන ලද බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා නම් කරන්න. (ලකුණු 01 යි)

ෆ්‍රෙඩ්රික් නෝත්

(iii) ශ්‍රී වික්‍රම රාජසිංහ රජ සමයේ දී මහාදිකාරම තනතුර දැරූ රදළයන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02 යි)

පිළිමතලව්වේ, ඇහැලේපොල, මොල්ලිගොඩ

(iv) 1815 දී බ්‍රිතාන්‍යයන් උඩරට රාජධානිය අල්ලා ගත් ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 12 යි)

- 1796 දී දිවයිනේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන් වෙතින් ලබාගැනීමට බ්‍රිතාන්‍යයන් සමත් විය.
- 1798 දී උඩරට පාලකයා වශයෙන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු පත්විය.
- 19 වන සියවස එළඹෙන විට මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටය යටතේ පාලනය වන අතර ක්‍රමයෙන් බ්‍රිතාන්‍යයන්ගේ අවධානය උඩරට අත්පත් කරගැනීම කෙරෙහි යොමු වේ. ඊට බලපෑ හේතු කිහිපයකි:
- මුහුදුබඩ ප්‍රදේශවල තම පාලනයට රට මැද ස්වාධීන ස්වදේශීය පාලන ඒකකයක් පැවතීම බාධාවක් බව කල්පනා කිරීම (1797/98 මුදලිවරුන්ගේ කැරැල්ලට උඩරට පාලකයා සහාය දුන්නේ යයි විශ්වාස කිරීම).
- වාණිජ අරමුණු (කුළුබඩු ලබාගැනීම).
- කොළඹ හා ත්‍රිකුණාමලය යා කොට මහාමාර්ගයක් ඉදිකිරීමට උඩරට රාජධානිය පැවතීම බාධාවක් වීම.
- උඩරට-ප්‍රංශ මිත්‍රත්වයක් ගොඩනැගෙතියි පැවති සැකය.
- මුලින්ම නෝත් ආණ්ඩුකාරවරයාගේ සමයේ (1803) මැක්ඩොවල් සෙන්පති යටතේ ආක්‍රමණයක් සඳහා අසාර්ථක උත්සාහයක් ගැණිනි.
- මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා යටතේ උඩරට සමග මිත්‍රශීලී සම්බන්ධතා පවත්වා ගන්නා අතරේම උඩරට රාජධානිය අභ්‍යන්තරයේ ගැටුම් නිර්මාණය කිරීමේ උපායයක් අනුගමනය කිරීම (මේ සඳහා ජෝන් ඩොයිලි යෙදවීම).
- මේ වනවිට ක්‍රමයෙන් උඩරට ඇතැම් ප්‍රබල රදළයන් හා රජු අතර ගැටුම් වර්ධනය වීම (පිළිමතලව්වේ හා පසුව ඇහැලේපොල). බ්‍රිතාන්‍යයන් විසින් මෙම තත්ත්වය, විශේෂයෙන්ම ජෝන් ඩොයිලිගේ මැදිහත් වීමෙන් ස්වකීය වාසියට හරවා ගැනීම.

➢ රජුගේ ඇතැම් ක්‍රියා භික්ෂූන් වහන්සේගේ හා ජනතාවගේ අප්‍රසාදයට හේතු වීම (1814 සබරගමු කැරැල්ල මර්දනය කළ ආකාරය / ඇහැලේපොල පවුලේ සාමාජිකයන් ඝාතනය / නුවර වැව තැනීමේදී ඇති වූ අප්‍රසාදය / රජු නායක්කර් ඥාතීන්ට දැක් වූ පක්ෂග්‍රාහී බව).

➢ ඇහැලේපොලගේ සහාය බ්‍රිතාන්‍යයන්ට හිමිවීම සහ 1815 දී බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා විසින් උඩරට අත්පත් කරගැනීමට පියවර ගැනීම.

➢ 1815 මාර්තු 2-10 අතර අත්සන් තබා අවසන් වූ උඩරට ගිවිසුම මගින් බ්‍රිතාන්‍යයන් උඩරට අත්පත් කරගැනීම තහවුරු කරගැනීම.

➢ ඒ සමගම සමස්ත දිවයිනම බ්‍රිතාන්‍ය කිරීටයේ යටත්විජිතයක් බවට පත්වීම.

(ලකුණු 12 යි)

8. 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පහත සඳහන් මාතෘකා යටතේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමග සංසන්දනය කරන්න.
   (i) විධායකය
   (ii) ව්‍යවස්ථාදායකය

(ලකුණු 16 යි)

| 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව |
|---|---|
| ❖ ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් රැස්වී මහජන අදහස් සඳහා අවස්ථාවක්ද ලබාදී සම්පාදනය කිරීම. | ❖ පාර්ලිමේන්තු පටිපාටිය තුළින් සම්පාදනය කිරීම. |
| **විධායකය** | **විධායකය** |
| ❖ 1948 සිට අග්‍රාණ්ඩුකාරයා නම් වූ නාමික විධායක ධුරය ජනාධිපතිවරයා බවට පත් කිරීම. ජනාධිපති පත් කිරීම එංගලන්ත කිරීටයෙන් නොව මහජන ඡන්දයෙන් පත් වූ අගමැතිවරයා විසින් සිදු කිරීම. | ❖ නාමික විධායකයක් නොමැති අතර නියම විධායක බලය මහජන ඡන්දයෙන් පත් වන ජනාධිපතිවරයා සතුවීම. |
| ❖ නියම විධායකය වූ කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා අගමැතිවරයාය. | ❖ කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා විධායක ජනාධිපතිවරයා වීම. |
| ❖ ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී සිටී. | ❖ ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී නැත. |
| ❖ ව්‍යවස්ථාදායකය විසුරුවාහළ විට විධායකය අහෝසි විය. | ❖ විධායකය එසේ අහෝසි නොවේ. |
| **ව්‍යවස්ථාදායකය** | **ව්‍යවස්ථාදායකය** |
| ❖ ව්‍යවස්ථාදායක සභාව ජාතික රාජ්‍ය සභාව ලෙස නම් කිරීම. | ❖ එය නැවතත් පාර්ලිමේන්තුව ලෙස හැඳින්වීම. |
| ❖ උත්තරීතර වේ. | ❖ නිල කාලය වසර 5 කි. |

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

| | |
|---|---|
| ❖ නිල කාලය වසර 6 යි.<br><br>❖ සියලු මන්ත්‍රීන් මහජන ඡන්දයෙන් පත්විය (සරල බහුතර ක්‍රමය).<br><br>❖ විශ්වාසභංගය | ❖ සමානුපාතික නියෝජන ක්‍රමයට මන්ත්‍රීවරුන් තෝරා ගැනේ (ඡන්දයෙන් 196 යි ජාතික ලැයිස්තුවෙන් 29).<br><br>❖ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය ජනාධිපතිවරයා සතු වේ (මෑතක සිදුකරන ලද සංශෝධන මගින් මේ සඳහා විශේෂිත කොන්දේසි පනවා ඇත).<br><br>❖ දෝෂාභියෝගය |

(ලකුණු 16 යි)

**9.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) කෝට්ටේ ධර්මපාල
(ii) ශ්‍රී ලාංකේය සමාජය හා සංස්කෘතිය කෙරෙහි ලන්දේසීන් ඇති කළ බලපෑම
(iii) දහනවවන සියවසේ දෙවන භාගයේ ඇති වූ හින්දු හා ඉස්ලාම් පුනර්ජීවනය
(iv) අමද්‍යප ව්‍යාපාරය

(ලකුණු 08 × 2 = 16 යි)

### (i) කෝට්ටේ ධර්මපාල

- කෝට්ටේ අවසාන සිංහල රජුය. 1541 ඉපිද 1597 දී මිය ගියේය. පියා- වීදියේ බණ්ඩාර, මව-හත්වන බුවනෙකබාහු රජුගේ දියණිය වූ සමුද්‍ර දේවී.
- ෆ්‍රැන්සිස්කන් පූජකවරුන් යටතේ අධ්‍යාපනය ලැබීම.
- සම්පූර්ණ නාමය-දොන් ජුවන් (බෞතීස්ත්මයෙන් පසුව ලද නම) ධර්මපාල පෙරිය බණ්ඩාර.
- බුවනෙකබාහු රජුට පුතුන් නොසිටි බැවින් රාජ්‍ය උරුමය මොහුට පවරාදුණි.
- සීතාවක රජවරුන්ගෙන් එල්ල වූ තර්ජන හමුවේ බුවනෙකබාහු රජු විසින් මොහුගේ ආරක්ෂාව පෘතුගීසීන්ට පවරන ලදී (පිළිමයක් පෘතුගාලයට යවා බෞතීස්ත්ම කරවීම).
- 1551 දී රාජාභිෂේකය ලැබීම.
- උඩරට කරලියද්දේ බණ්ඩාරගේ සොයුරිය වූ දෝන ඉසබෙලා සහ දියණිය වූ දෝන මාගරිටා මොහුගේ බිසෝවරු වූහ.
- පෘතුගීසීන් යටතේ නාමමාත්‍රික දුර්වල පාලකයෙකි. කෝට්ටේ ජනතා අප්‍රසාදයක් පැවති බව කියැවේ. අවසාන කාලය කොළඹ බලකොටුවේ ජීවත් විය.
- 1581 දී කෝට්ටේ රාජධානිය තෑගි ඔප්පුවකින් පෘතුගීසි අධිරාජයා වෙත පවරනු ලැබීය.

(ලකුණු 08 යි)

PAST PAPERS WIKI

**(ii) ශ්‍රී ලාංකේය සමාජය හා සංස්කෘතිය කෙරෙහි ලන්දේසීන් ඇති කළ බලපෑම**

- නව ජන කොටසක් නිර්මාණය වීම - බර්ගර් (ලන්සි).
- භාෂාවට නව වචන එක්වීම- සොල්දර, ජනේල, හාරිච්චි, කුච්තාන්සි, ඉස්කෝල
- ආහාර වර්ග - කේක්, කොකිස්
- ගෘහනිර්මාණ ශිල්පයට ඇති කරන ලද ශෛලීමය බලපෑම-විශාල කුළුණු, මැද මිදුල (වුල්ෆෙන්ඩොල් දේවස්ථානය, ගාලු කොටුවේ දේවස්ථානය, ලන්දේසි රෝහල).
- වාණිජ බෝග වගාව සමග හටගත් සමාජ-සංස්කෘතික වෙනස්වීම (කුරුඳු, කෝපි).
- ආගමික බලපෑම (ලන්දේසි රෙපරමාදු ආගම).
- අධ්‍යාපනය
- මුද්‍රණ යන්ත්‍රය හඳුන්වාදීම නිසා හටගත් පරිවර්තනය.
- කුල සංචලනය.

**(ලකුණු 08 යි)**

**(iii) දහනවවන සියවසේ දෙවන භාගයේ ඇති වූ හින්දු හා ඉස්ලාම් පුනර්ජීවනය**

- පසුබිම: ක්‍රිස්තියානි මිෂනාරිවරුන්ගේ ආගම් ප්‍රචාරය කිරීමේ කටයුතු හේතු කොට ගෙන බෞද්ධ, හින්දු හා ඉස්ලාම් ආගම්වලට එල්ල වූ අභියෝගයට එරෙහිව එම ආගමිකයන් ප්‍රතිචාර දැක්වීමට ඉදිරිපත් වීම.

- හින්දු පුනර්ජීවනය:
    - ආරුමුග නාවලර් තුමා පුරෝගාමී වීම.
    - ඔහු 1872 දී ශෛව ප්‍රගාශ විද්‍යාශාලෙ නම් පාසල පිහිටුවා හින්දු දරුවන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදීමට කටයුතු කිරීම.
    - දෙමළ භාෂා සාහිත්‍යය හා සංස්කෘත භාෂා අධ්‍යයනය දිරිගැන්වීමට එතුමා පෙරමුණ ගැනීම.
    - වන්නර්පොන්නෙයිහි මුද්‍රණාලයක් ආරම්භ කොට හින්දු ආගමික පුනර්ජීවනයට අදාළ පොත පත, ලිපි ප්‍රකාශයට පත් කිරීම.

      ශෛවාගමට අදාළ පැරණි පොත පත සංස්කරණය කිරීම හා නව ග්‍රන්ථ රචනා කිරීම; බයිබලයේ කොටස් දෙමළ බසට පරිවර්තනය කිරීමට සහාය වීම.

    - නාවලර්තුමා සංස්කෘත හා ඉංග්‍රීසි ආදී භාෂාවල ලද ප්‍රවීණත්වය පුනර්ජීවන කටයුතු සඳහා මැදිහත්වීමට යොදාගැනීම.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



- ඉස්ලාම් පුනර්ජීවනය:
  - එම්. සී. සිද්දි ලෙබ්බේ පුරෝගාමී විය.
  - ඉස්ලාම් අධ්‍යාපනය නගා සිටුවීම: 1884 සහිරා විද්‍යාලය හා 1893 මහනුවර මුස්ලිම් බාලිකා විද්‍යාලය පිහිටුවීම.
  - ඉංග්‍රීසි හා අරාබි භාෂා උගැන්මට මුස්ලිම්වරුන් දිරිගැන්වීම. මද්රාසා පාසල් ආරම්භ කිරීම.
  - 'මුස්ලිම් නෙයිසන්' පුවත්පත ආරම්භ කිරීම.
  - Ceylon Islam Review සඟරාවට අධ්‍යාපනයේ වැදගත්කම අවධාරණය කරමින් ලිපි සැපයීම.
  - ඔරාබි පාෂාගෙන් මෙම පුනර්ජීවන කටයුතු සඳහා විශාල අනුබලයක් ලැබීම.

**(ලකුණු 08 යි)**

**(iv) අමද්‍යප ව්‍යාපාරය**

- 19 වන සියවස අවසාන භාගය වනටවි බ්‍රිතාන්‍ය ආණ්ඩුව ප්‍රධාන ආදායම් මාර්ගයක් වශයෙන් සුරාබදු ප්‍රතිපත්තිය සකස් කරගන්නා ලදී.
- ඒ සමගම මත්පැන් හා මද්‍යසාර භාවිතය ඉහළගිය අතර එය මෙරට සමාජ ගැටළුවක් බවට පත්වෙමින් තිබිණි.
- 19 වන සියවස අවසාන කාර්තුවේදී මෙම බ්‍රිතාන්‍ය ප්‍රතිපත්තියට මුලින්ම ක්‍රියාකාරී ලෙස එරෙහි වූයේ මෙරට සිටි මිෂනාරි කණ්ඩායම්ය.
- 20 වන සියවස එළඹෙන විට එම විරෝධය වඩාත් සංවිධානාත්මක හා ප්‍රබල ව්‍යාපාරයක් බවට පත් කරන ලද්දේ පැවිදි හා ගිහි බෞද්ධ නායකයන් විසිනි.
- පුළුල් වශයෙන් ගත් කල අවධි දෙකකි:
  1) 1903-05 අතර කාලය
  2) 1911-14 අතර කාලය
- මුල් අවස්ථාව - ගුරුවරුන්, දේශීය වෛද්‍යවරුන්, නොතාරිස්වරුන් වැනි ග්‍රාමීය නායකයන් මතුවීම.
- පසුව ක්‍රමයෙන් මෙය බ්‍රිතාන්‍ය යටත්විජිත ප්‍රතිපත්ති විවේචනය දක්වා ව්‍යාප්ත වීම.
- එමෙන්ම කිතුණු ආගමික නායකයන්ගේ මතවාද විවේචනයට යොමුවීම.
- අනගාරික ධර්මපාල තුමා, දොන් ස්පේටර් සේනානායක, වැනි අයගේ නායකත්වය.
- හාපිටිගම සංගමය වැනි ප්‍රබල සංගම්.
- බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය හා සම්බන්ධ වීම.
- 1915 සිංහල-මුස්ලිම් කෝලාහල අවස්ථාව යොදාගනිමින් බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් මෙහි ඇතැම් නායකයන් මර්දනය කිරීම.

**(ලකුණු 08 යි)**

***